අධ්‍යාපන, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය
கல்வி, விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சு
Ministry of Education, Science and Technology
'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/04/60/16/08/2024/2-1

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2024. 10. 01

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරු වෙත

**ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් I ශ්‍රේණියට උසස් කිරීම.**

අංක 1885/31 හා 2014.10.22 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාව සහ එම ව්‍යවස්ථාවට පසුව සිදු කරන ලද සංශෝධනයන්ද අදාළ කර ගනිමින් 2012.01.24 දින ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 පන්තියට පත් කරන ලද නිලධාරීන් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**02. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I ශ්‍රේණියට උසස් කිරීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම්**

අ). පහත සුදුසුකම් සම්පූර්ණ කරන ලද නිලධරයන් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

(i) උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර 06ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක 06ක් උපයාගෙන තිබීම.

(ii) නියමිත දිනට 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම. (නියමිත කාලය තුළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් නොමැති නම් සහන ලබා තිබිය යුතුය.)

(iii) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 අනුව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

(iv) අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර හය (06) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

(v) උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට අවම වශයෙන් පහත සඳහන් එක් සුදුසුකමක් හෝ සම්පූර්ණ කර තිබීම(සහතික පත හා එහි ප්‍රතිඵල සනාථ ලිපිය යන 2 ම ඉදිරිපත් කළ යුතුය)

- a. අධ්‍යාපනවේදී උපාධිය (B.Ed)
- b. පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව (PGDE)
- c. පාසල් කළමනාකරණ ඩිප්ලෝමාව (DSM)
- d. පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමාව (PGDEM)

(vi) ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලාව 2 සමත් වී තිබිය යුතුය.

ආ). ඉහත 02 හි සුදුසුකම් සම්පූර්ණ කර ඇති ජාතික පාසල්වල සේවයේ නියුතු නිලධාරීන් මේ සමඟ වන ආකෘතිය (ඇමුණුම 01 හා 02) අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශ සහිතව ද,

ඇ). ඉහත 02 හි සුදුසුකම් සම්පූර්ණ කර ඇති පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් මේ සමඟ වන ආකෘතිය (ඇමුණුම 01 හා 02) අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ හා පළාත් අධ්‍යාපන ලේකම්ගේ නිර්දේශ සහිතව ද,

" සහකාර ලේකම්, විදුහල්පති ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල," යන ලිපිනයට යොමු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

03. තවද, ඔබ පළාත තුළ සේවයේ නිරත සියලුම විදුහල්පති ශ්‍රේණිධාරීන් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සේවා ව්‍යවස්ථාවට අනුව ඔවුන්ගේ උසස්වීම් සඳහා අයදුම් කළ යුතු ක්‍රමවේදය පිළිබඳව, දැනුවත් කරන මෙන් දන්වන අතර අදාළ ඉල්ලුම්පත සහ උසස්වීම් ආකෘති පත්‍රය www.moe.gov.lk ඔස්සේ බාගත කළ හැකි බව ද වැඩිදුරටත් දන්වමි.

ජේ.එම්. තිලකා ජයසුන්දර
ලේකම්

පිටපත:- පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ , .......................... පළාත } කාරු. සියලුම කලාප කාර්යාල දැනුවත් කිරීම සඳහා හා දැ.ගැ. සඳහා